# 6.1.4 ගම්පොළ රාජධානිය

## අභ්‍යාස



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

## බහුවරණ ප්‍රශ්න.

1. 12 සියවස වන විට ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වන දැදිගම ඊට පෙර හඳුන්වන ලද්දේ
    1. ජම්බුද්‍රෝණි නමිනි.
    2. පුංඛගාම නමිනි.
    3. සුන්දරගිරි නමිනි.
    4. ගඟසිරිපුර නමිනි.
    5. රයිගම නමිනි.

2. ප්‍රථම වතාවට කෝට්ටේ බලකොටුවක් ඉදිකරන ලද්දේ,
    1. සේනාධිලංකාර සෙනෙවිරත් විසිනි.
    2. වීර අලකේශ්වර විසිනි.
    3. නිශ්ශංක අලකේශ්වර විසිනි.
    4. කුමාර අලකේශ්වර විසිනි.
    5. පරාක්‍රම ඇපා විසිනි.

3. ගම්පොළ යුගයට අයත් ගඩලාදෙණිය, ලංකාතිලකය වැනි වෙහෙර විහාරවල කලා කටයුතු සිදුකරන ලද්දේ,
    1. ධම්මවංශ හිමි සමග පැමිණි ගනේශ්වරාචාර්ය ඇතුළු කලාකරුවන් විසිනි.
    2. බුද්ධපුත්‍ර හිමි සමග පැමිණි ගනේශ්වරාචාර්ය ඇතුළු කලාකරුවන් විසිනි.
    3. මේධංකර හිමි සමග පැමිණි ගනේශ්වරාචාර්ය ඇතුළු කලාකරුවන් විසිනි.
    4. ධර්මකීර්ති සමග පැමිණි ගනේශ්වරාචාර්ය ඇතුළු කලාකරුවන් විසිනි.
    5. නන්තුර් තුනයා සමග පැමිණි ගනේශ්වරාචාර්ය ඇතුළු කලාකරුවන් විසිනි.

4. චීනය සිට පැමිණි චෙංහෝ සෙනෙවි විසින් ගාල්ලේ පිහිටුවන ලද ත්‍රිභාෂා සෙල්ලිපියෙහි ඇතුළත් භාෂා වන්නේ ,
    1. චීන, පර්සියන්, හින්දු
    2. චීන, දෙමළ, ජපන්.
    3. චීන, පර්සියන් , දෙමළ.
    4. චීන, දෙමළ, අරාබි.
    5. චීන, පර්සියන්, පෘතුගීසි.

5. පහත “ අ ” සහ “ ආ ” තීරු යා කළ විට නිවැරදි පිළිතුර වන්නේ,

| “අ ” | “ ආ ” |
|---|---|
| නිකාය සංග්‍රහය | A ශීලවංශ ධම්මරක්ඛිත හිමි |
| මයුර සංදේශය | B විල්ගම්මුල හිමි. |
| පාරමී ශතකය | C ජයබාහු දේව රක්ඛිත හිමි. |
| විමුක්ති සංග්‍රහය | D කවීශ්වර පඬිතුමා. |

1. ABCD　2. DCBA　3. CBAD　4. CDBA　5. CDAB

## ව්‍යුහගත රචනා ප්‍රශ්න.

1. ගම්පොළ රාජධානි සමයේ දී බලවත් වූ ප්‍රභූ පවුල් දෙක නම් කරන්න.

2. ගම්පොළ රාජධානි සමයේදී නිශ්ශංක අලගක්කෝණාර සෙනවියාගෙන් ඉටු වූ දේශපාලන සංසිද්ධි විස්තර කරන්න.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk